සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

71 S I

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்**
**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

| | | |
|---|---|---|
| **12 ශ්‍රේණිය**<br>**Grade 12** | **සිංහල - I**<br>**Sinhala - I** | **පැය තුනයි**<br>**Three hours** |

**සැලකිය යුතුයි :**

- **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

අ) බුදුහු එදවස් අලුයම් වේලෙහි මහකුලුණු සමවතට සමවැද එයින් නැඟී පෙර බුදු වූ බුදුවරුන්වහන්සේ සමයෙහි මහත් සේ කොට පුරාපී පින්කම් ඇති හේතු සම්පන්න පුද්ගලයන් දක්නා පිණිස බුදු ඇසින් ලොව බලන සේක් දසදහසක් සක්වළ නැමැති මහමුහුද වසා නුවණදැල දැමුසේක. **මට්ටකුණ්ඩලී** නැමැති කුඩමසු පිළ නැමැති දියකොල්බඩ හොත්තේ බුදුන්ගේ නුවණැදලට තමා සම්භ වුවමනා හෙයින් වැදහොත් ලෙසින් ම නොසෙල්වී නොපෙරළී නුවණදැල බැඳිණ. බුදුහු ඔහු දැක ''මා එතනට යාමෙන් වන ප්‍රයෝජන කවරේ දෝහෝ යි පරීක්ෂා කරන සේක් මා එතනට ගිය කල මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත පහදවාගෙන කොටගත් අනික් පින්කමක් නැතත් සිත පහදවාගත් පමණකින් මිය ගොසින් තවුතිසා දෙව්ලොව එක්සිය විසිගව්වක් විතර උස ඇති රන්විමනෙක උපදී. ඔහු පිරිවරා දෙවගනෝ දහසක් දෙනා පහළ වෙති. බමුණු මියගිය පුතු දවාපියා මළ පුතු අරහයා හඬමින් දවාපු සොහොනෙහි ඇවිද්දී.''

i. බුදුහු අලුයම් වේලෙහි ලොව බලන්නේ කුමක් පිණිස ද?
ii. මට්ටකුණ්ඩලීට දෙව්ලොව ඉපදීමට හේතු වන්නේ කුමක් ද?
iii. ''මට්ටකුණ්ඩලී නැමැති කුඩමසු පිළ නැමැති දියකොල්බඩ හොත්තේ'' යන්න ලිහිල් බසින් ලියන්න.
iv. ''මට්ටකුණ්ඩලී'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

ආ) මැණියෝ එ බස් අසා තමන් අතුරෙහි සිනාසී ''මාගේ පුතණුවෝ තමන් ශ්‍රීමත් **කුලුදුලෙහි උපන්** හෙයිනුත් මහපින් ඇති හෙයිනුත් නැතැ යි යන බසෙහි අර්ථ නො දනිති. මපුතණුවන් මතු රාජ්‍යය කරන කල නැතැයි යන බසක් නො කියා රාජ්‍යය කළ නො හැක්කේ ම වේ ද ම පුතණුවන් නැතැ යි යන බසෙහි අර්ථ උගන්වමි''යි සිතාලා රන්තලියක් ශුද්ධ කරවා පියා අනික් රන්තලියකින් වසාලා'' තෙල නැති පූ මපුතණුවන්ට දෙව' යි කියා නිකම් තලිය යවුවාහුය. එ කෙණෙහි එ නුවර අරක්ගත් දේවතාවා'' මාගේ අනුරුද්ධ කුමාරයෝ මවු කුසින් උපන් දැ පටන් නැතැ යි යන බසෙහි අර්ථ නො දන්නාහු ය. අද එ බසෙහි අර්ථ දැනපූ නම් උන්ගේ පින් බලයෙන් මාගේ හිස සත්කඩක් ව පැළී යෙයි'' කියා මරණභයින් වෙවුලා එ ගෙණ යන්නා වූ තලියෙහි දිව්‍ය වූ සුවඳ කැවුම් මවාලී ය.

i. 'පුතණුවන්ට නැත' යන්නෙහි අර්ථ ඉගැන්විය යුතුය'යි මැණියන් සිතන්නේ ඇයි ?

ii. මැණියන් විසින් රන්තලියකින් වසා යවන්නේ කුමක් ද?

iii. 'එ කෙණෙහි එ නුවර අරක්ගත් දේවතාවා' යන්න ලිහිල් බසින් ලියන්න.

iv. 'කුලුඳුලෙහි උපන්' යන යෙදුමට විවරණ සපයන්න.

(ලකුණු 04)

ඇ) ලුම්බිනි වනෝද්‍යානයෙහි මහා බ්‍රහ්මයා අතට බිහිව වැඩිවිය පැමිණි සියලු ලෝකධාතුයෙහි අසදෘෂාභිෂේකප්‍රාප්තව උයන් කෙළියට යන සඳ දෙවියන් මවාලූ ජීර්ණ ව්‍යාධි මෘත යන තුන් පූර්වනිමිත්ත දැක සසර කළකිරී සතරවැනි දෙවියන් මවාලූ මහණ වේශය දැක මහණ වීමෙහි උත්සහ ඇතිව මහබිනික්මන් කළ බව ද සාවුරුද්දක් සැරිසරා වෙසඟ මස මැදි පොහො දවස බෝමැඩ විදුරසුන් අරා වැඩ හිඳ බුදුව ක්‍රමයෙන් සත්සති ගෙවා අටවෙනි සතියෙහි මහබඹු අයජමෙන් බරණැස **ඉසිපතන** නම් උයන්හි දම්සක් පවත්වා දෙව්බඹුන් විමසන පරිදි ක්‍රමයෙන් උරුවෙලාවට වැඩ දහසක් ජටිලයන් රහත් කොට බිම්සර රජහට දුන් පිළින සඳහා රජගහ නුවර සමීපයෙහි ලට්ඨී වන නම් උයනට ගොස් ඒ සමාගමයෙහි උරුවෙල කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් කරන ලද සිංහනාදය දක්වා අපණ්ණක ජාතකයෙහි කී නියායෙන් දත යුතුය.

i. මහණ වීමට අදහසක් ඇති වූයේ කුමක් දැකීමෙන් ද?

ii. රජගහ නුවරට වැඩියේ කුමක් සඳහා ද?

iii. ''අසදෘෂාභිෂේකප්‍රාප්තව'' යන්න ලිහිල් බසින් ලියන්න.

iv. ''ඉසිපතන'' යන යෙදුමට විවරණ සපයන්න. (ලකුණු 04)

ඈ) මහත් වූ වීර්ය ඇති අනන්තඥානයෙන් යුක්ත වූ ස්වම්භූඥානයෙන් සියල්ල ගෙවා දත්තා වූ මුළු ලොවට හිතාන්වෙසී වූ තුන් ලොවට අසහාය නායක වූ ලෝකස්වාමි වූ අනාථ නාථ වූ භාග්‍යවත් වූ ත්‍රෛලොක්‍ය ශාස්තෘ වූ බුදුරජාණන්වහන්සේ උදෙසා දූත් මා විසින් පුදන ලද්දා වූ මේ මල් පූජාවෙන් අනුසසින් මතු සසර මම උපනුපන් ජාතියෙහි යහපත් රූ ඇති වෙම්ව යි මනෝඥ වූ **ආරෝහපරිණාහයෙන්** යුක්ත වෙම්ව යි ශරත් කාලයෙහි ගුවන් මැද දිලියෙන සූර්ය මණ්ඩලය පරිද්දෙන් මාගේ සියලඟින් රස්මි මාලාවෝ විහිදෙත්ව යි මා දුටුවා වූ යම් ම පුරුෂයෙක් කාමයෙන් මූර්ඡාව හෙ යි ලියකිඳුරන්ගේ නාද මෙන් සියල්ලවුන් ළගන්නා ඉතා කන්කලු වූ මිහිරි කටහඬ ඇති වෙම්ව යි යනාදීන් මෙසේ ප්‍රාර්ථනා කළා ය.

i. මෙහි සඳහන් ප්‍රාර්ථනාවන් ඉෂ්ටවන්නේ කුමක් නිසා ද?

ii. ශරීරයෙන් රශ්මිය විහිදිය යුත්තේ කුමන ආකාරයට ද?

iii. ''ලෝකස්වාමිවූ අනාථ නාථ වූ භාග්‍යවත් වූ ත්‍රෛලොක්‍ය ශාස්තෘ වූ'' යන්න ලිහිල් බසින් ලියන්න.

iv. ''ආරෝහපරිණාහයෙන්'' යන වචනයට විවරණ සපයන්න. (ලකුණු 04)

ඉ)

| | |
|---|---|
| සව් සත | කුලුණැසින් |
| සව් සත තියුණු | නැණැ'සින් |
| නිති දක්නා | විසින් |
| එ රජම ය යුතු වූයේ | යුගැ'සින් |
| | |
| ඔහු තෙද | දිවසකර |
| දිලිහෙත විකුම් | ගිරිසිර |
| පෙර සිටි රඟ | නොහැර |
| සිටි ද පර රද යස | **තුසරකර** |

i. රජතුමා විසින් සියලු සත්වයන් දකින්නේ කෙසේ ද?

ii. රජුගේ වික්‍රමය සමාන කර ඇත්තේ කාහට ද?

iii. ''සව් සත තියුණු නැණැසින්'' යන්න ලිහිල් බසින් ලියන්න.

iv. ''තුසරකර'' යන වචනයට විවරණ සපයන්න. (ලකුණු 04)

ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක්** අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. ''යම් ලෙසක් කළ කල මාගේ වස්තුවට හානියෙක් නොවේ නම් ඒ ලෙසක් කෙරෙමි.''

ii. ''ස්වාමීනි, තෙල නැති පූ කෑම මැනැවි''

iii. ''මේ දෙව් සැපත නිකම් හුන් පමණකින් ලද හැක්කේ නොවෙයි''

iv. ''එන්න ගෙට ඇවිත් ගේ ඇතුළේ බුදියගන්න''

v. ''චණ්ඩාල කෙලි නම් තෙපි ම යැ''

vi. ''ඇයි උඹ විල අත්හැරදාලා ආවේ''

vii. ''ඔබතුමා කියන බස් අසා අපි කැළඹුණෙමු''

(ලකුණු 3 × 4 =12)

උ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මිනිහා නඟන කටහඬ නො ම වැකෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගහක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා කැමති නැත හිරවී විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමුවන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මවුපිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජමුතුව
පැටවගෙ දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිළෙන්නට නැතුව

දවසට සිය විටක් මවු පිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිළෙන සිහින පිට මං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

The National e-learning Portal for The General Education

උවදුරු එමට ඇති මුත් එළිමහන තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලක් ගත වේවිද මෙහෙම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

සටනක් නැති ව සැපතක් ඇති විය නොහැක
මේ රැකවරණ තුළ ඇති සුවසිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

මවුපිය කුරුල්ලන් ආහර රැගෙන කටින්
ආවා පුරුදු ලෙස පැටියා දකින අටින්
දුටුවා හිස් ව ඇති බව ගෙය එහෙම පිටින්
පැටවා ගිහින් එළි වෙන කොට හතර වටින්

(ලකුණු 12)

(02) සද්ධර්මරත්නාවලී කතුවරයා දක්ෂ කතාකරුවකු ලෙස පාඨකයාගේ සිත් ඇදගනී. මට්ටකුණ්ඩලී කථාව ඇසුරෙන් විමසන්න.

**නැතහොත්**

ජාතක කතාවන්හි ඇති විදග්ධ භාෂා ශෛලිය පිළිබඳව ඔබට නියමිත කතාවක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

(03) මිනිසා යහපත් මාර්ගයට යොමු කරවීමට සද්ධර්මාලංකාර කතුවරයා දැරූ උත්සාහය නියමිත කතාවක් මඟින් විමසන්න.

**නැතහොත්**

සැදැහැති ජනතාවට උපදෙස් ලබාදීම පූජාවලී කතුවරයාගේ අරමුණකි. අනුරුද්ධ කුමාර කථා වස්තුව මඟින් විමර්ශනය කරන්න.

(ලකුණු 15)

(04) ගුත්තිල කාව්‍ය කතුවරයා සරල බස් වහර කෙරෙහි දක්වා ඇති උනන්දුව බරණැස අසිරිය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 15)

(05) බැද්දේගම නවකතාව තුළ ස්වභාව ධර්මය තත්ත්වාකාරයෙන් කතුවරයා විචිත්‍ර කර ඇත. සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

(06) ලෝකයේ යථා ස්වභාවය නිරූපණය කිරීමට කෙටිකතාකරුවා දැරූ උත්සාහය වෙසක් පහන කෙටිකතාව ඇසුරෙන් අගය කරන්න.

(ලකුණු 15)

(07) අද්‍යතන කවීන් ස්වභාවධර්මයේ අපූර්වත්වය පෙන්වා දුන් අයුරු සමනලයා පද්‍ය පන්තිය ඇසුරෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15)

(08) 'පෙමතො ජායති සොකො' නාට්‍යයේ මූලාශ්‍රය පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 15)